# 8. රාජ්‍ය මූල්‍ය

සාර්ව ආර්ථික ස්ථායීතාවය දියුණු කිරීම, ආර්ථිකය තුළ ආයෝජන සහ ඉතුරුම් වැඩිකිරීම, රැකියා උත්පාදනය ඉහළ නැංවීම සහ දිළිඳු බව තුරන් කිරීම යන අරමුණු මුල් කොටගෙන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රමෝපාය සැලසුම් කරන ලදී.

සරළ, අඩු බදු අනුපාත සහ විෂමතා රහිත බදු ක්‍රමයක් ඇති කිරීම, රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය, නිෂ්ඵල සහ ප්‍රමුඛත්වය නොමැති වියදම් කපා හැරීම හා රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් වියදම් අර්ථාන්විතව සිදුකිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ මගින් ඉලක්ක කෙරුණි. මෙම ප්‍රතිසංස්කරණයන් ආර්ථිකයෙහි විවිධ බාධකවලට මුහුණදීමට ඇති හැකියාව ශක්තිමත් කළ අතර පුද්ගලික අංශයේ සහභාගිත්වයද වැඩිකිරීමට හේතුවිය.

- ▲ මෑත කාලයේදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි මූලික කාර්යභාරය වූයේ අයවැය හිඟය අඩුකිරීමයි. සමස්ත අයවැය හිඟය 1995 පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 10.1 සිට 1999 දී සියයට 7.5 දක්වා අඩු කරන ලදී.
- ▲ රාජ්‍ය මූල්‍ය තත්ත්වය ස්ථාවර කිරීමේ කටයුතුවල දියුණුව නිසා රජයට 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.7 ක්ව පැවති සෘණ-ඉතුරුම් තත්ත්වය 1999 වනවිට සියයට 1 දක්වා අඩුකර ගැනීමට හැකිවිය.
- ▲ කෙසේ වුවද, ආරක්‍ෂක වියදම් නිසා වූ අස්ථායී බලපෑම නිසා 2000 වර්ෂයේදී රජයේ සෘණ-ඉතුරුම් ප්‍රතිශතය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.4 දක්වා වැඩිවූ අතර සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.8 දක්වා වැඩිවිය.
- ▲ රජයේ වියදම් අඩුකිරීම සහ නොකඩවා කරගෙන යනු ලබන බදු ප්‍රතිසංස්කරණයන් යටතේ ආදායම් මට්ටම පවත්වා ගැනීම මගින් රාජ්‍ය මූල්‍ය තත්ත්වය ස්ථාවර කිරීමට ප්‍රයත්න දරනු ලැබිණ.
- ▲ රජයේ මුළු වියදම 1995 පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 30.5 සිට 1999 දී සියයට 25.1 දක්වා අඩුවූ නමුත් 2000 දී එම වියදම් නැවත සියයට 26.6 දක්වා වැඩිවිය. රජයේ ආදායම් 1995 පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 සිට 2000 වර්ෂයේදී සියයට 16.7 දක්වා අඩුවිය.
- ▲ ආදායම් රැස්කිරීම අඩුවීම කෙරෙහි එක්තරා දුරකට බදු ක්‍රමය යථාර්ථවත් කිරීම හේතුවිය. රජය විසින් මෑත කාලය තුළදී බදු ක්‍රමය සරල කිරීම, පුද්ගලික ආයෝජන වැඩිකිරීම හා බදු බර අඩුකිරීම සඳහා බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය මූල්‍ය දර්ශක




8.1 රූපසටහන

ආදායම් සංයුතිය 2000




8.2 රූපසටහන

- තීරුබදු ව්‍යුහය යථාර්ථවත් කිරීම යටතේ බදු අනුපාත තත්ත්ව තුනක සිට දෙකක් දක්වා අඩුකිරීම සහ උපරිම තීරුබදු අනුපාත සියයට 40 සිට 25 දක්වා අඩුකිරීම සමග ජාත්‍යන්තර වෙළඳාම මත වූ බදු අඩුවිය.

- 1998 දී භාණ්ඩ හා සේවා බද්ද මගින් පිරිවැටුම් බද්ද ඉවත් කරන ලද අතර, එමගින් පිරිවැටුම් බදු යටතේ වූ බදු මත බදු අයකිරීම නැති වූ අතර එය බදු බර අඩුකිරීමට හේතුවිය. අත්‍යවශ්‍ය භාණ්ඩ සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් බදු ව්‍යුහයෙන් ඉවත් කිරීම මගින් භාණ්ඩ හා සේවා බද්ද මගින් අඩු ආදායම් ලබන්නන් සඳහා සහනයන් සලසා දී ඇත.

- ආදායම් ජනනය කරනු නොලබන විශාල නිෂ්පාදන සංඛ්‍යාවක් නිෂ්පාදන බදු ව්‍යුහයෙන් ඉවත් කිරීම සහ සිගරැට්, මත්පැන්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ මෝටර් රථ වැනි නිෂ්පාදිත සුළු සංඛ්‍යාවක් පමණක් බදු අයකිරීමට යටත් කිරීම මගින් නිෂ්පාදන බදු යථාර්ථවත් කරන ලදී.

- බදු අය නොකරන ආදායම් සීමාව ඉහළ දැමීම සහ සාමූහික අංශය සඳහා බදු සහන ලබාදීම හේතුවෙන් ආදායම් බදු බර අඩුවිය.

- මේ අතර වැඩිවන ආරක්ෂක වියදම්වලට අනුපාතිකව බදු ආදායම වැඩිකිරීම සඳහා 1995 දී සියයට 4.5 ක්ව පැවති ජාතික ආරක්ෂක බද්ද 2000 වනවිට සියයට 6.5 දක්වා ක්‍රමයෙන් වැඩි කල අතර, බදු පදනම බොහෝ සේවාවන් ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන ලදී.

- වියදම් අංශය සැළකීමේදී, දිළිඳුබව තුරන් කිරීමේ වැඩසටහන් ස්ථාවර කිරීම සහ නිෂ්ඵල වියදම් සහ ප්‍රමුඛතාවන් නොමැති පුනරාවර්තන වියදම් කපාහැරීම මගින් රජයට පුනරාවර්තන වියදම් සාර්ථක ලෙස අඩුකර ගැනීමට හැකිවී ඇත.

- පුනරාවර්තන වියදම් 1995 පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 23 සිට 2000 දී සියයට 20 දක්වා අඩුවිය. පුනරාවර්තන වියදම් අඩුවීමට ආරක්ෂක නොවන වියදම්හි අඩුවීම සම්පූර්ණයෙන්ම හේතුවිය.

- ආරක්ෂක කටයුතු සඳහා වූ වියදම් 1990-94 කාලයේදී පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.0 ක සාමාන්‍ය අගයක සිට 1995-2000 කාලය තුළදී සියයට 5.4 ක සාමාන්‍ය අගයක් දක්වා වැඩිවිය.

*රජයේ වර්තන වියදම*




*8.3 රූපසටහන*

*වියදම් සංයුතිය 2000*




*8.4 රූපසටහන*

- ▲ රජය විසින් එහි ප්‍රාග්ධන වියදම් වැඩසටහන් ප්‍රධාන ලෙස අධ්‍යාපනය, සෞඛ්‍යය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා යොදවන ලදී.

- ▲ කෙසේ වුවද, රාජ්‍ය ආයෝජනයන් 1995 දී පැවති දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 7.9 සිට 2000 දී සියයට 6.4 දක්වා අඩුවිය.

- ▲ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම පිහිටුවීම මගින් රාජ්‍ය ව්‍යවසායයන් පවරාදීමේ කටයුතු ශක්තිමත් කළ අතර ජනතාවට වගකීම සහ විනිවිදභාවය සහතික කිරීම මගින් පුද්ගලීකකරණ කාර්යාවලිය ක්‍රමානුකූල කරන ලදී.

- ▲ ශ්‍රී ලංකා ටෙලිකොම්, වැව්ලි සමාගම්, එයාර් ලංකා සහ කොළඹ ගෑස් සමාගම යනාදී ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් පුද්ගලීකරණය කිරීම සමගම ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සහ හිමිකම තබා ගැනීම (BOO)/ ඉදිකිරීම ක්‍රියාත්මක කිරීම හා පැවරීම (BOT) ක්‍රමයන් යටතේ ආයෝජනයන් උනන්දු කිරීම මගින් රාජ්‍ය අංශය ආයෝජනය කටයුතුවලට සහභාගිවීමේ අවශ්‍යතාවය එක්තරා දුරකට අඩු කරන ලදී.

- ▲ දේශීය හා විදේශීය අංශයන්හි පැවති අහිතකර තත්ත්වය නිසා 2000 වසරේ ක්‍රියාත්මක කිරීමට පැවති පුද්ගලීකරණ වැඩසටහන කල්දැමීම ආර්ථිකය මත අමතර පීඩනයක් ඇතිකරන ලදී.

- ▲ විදේශීය අංශයන්ගෙන් ලැබූ ණය ආධාර අඩුවීම නිසා අයවැය පියවීමේ කාර්යය ප්‍රධාන වශයෙන්ම දේශීය අංශය තුළින් සපුරා ගන්නා ලදී. රාජ්‍ය මූල්‍ය තත්ත්වය ස්ථායීකරණය කිරීමේ කාර්යය මග හැරී යෑම නිසා බැංකු අංශයෙන් ණය ගැනීම මෑත කාලයේදී වැඩිවිය.

- ▲ බැංකු අංශය මගින් රජයට ලබාදුන් ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1999 පැවති සියයට 2.5 සිට 2000 දී සියයට 3.6 දක්වා වැඩිවිය.

- ▲ මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වැඩසටහන මගින් නව මූල්‍ය උපකරණ හඳුන්වාදීමට සලස්වන ලද අතර එමගින් අයවැය මූල්‍යකරණ කටයුතු සඳහා වෙළඳපොළගත ණය උපකරණ කරා යොමු කිරීමද සිදුවිය.

- ▲ වෙළඳපොළ මූලික කරගත් භාණ්ඩාගාර බැඳුම්කර හඳුන්වාදීම මගින් රජයට මැදිකාලීන ණය වෙළඳපොළක් බිහි කිරීමට,

තෝරාගත් කාර්යයන් අනුව වියදම්




8.5 රූපසටහන

අයවැය හිඟය පියවීම




8.6 රූපසටහන

ද්විතියික වෙළඳපොළ උනන්දු කරවීම සහ රජයේ මැදිකාලීන ණය ව්‍යුහය දියුණුකර ගැනීමටද හැකිවිය.

- ▲ අයවැය හිඟය පියවීම සඳහා දේශීය සම්පත් මත විශ්වාසය තැබීම, රාජ්‍ය ණය ව්‍යුහයේ සංයුතිය වෙනස්වීමට හේතුවිය. 1995 දී දේශීය ණය, මුළු රාජ්‍ය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස පැවති සියයට 43 සිට 2000 වන විට සියයට 53 දක්වා වැඩි වී ඇත.

- ▲ 1995 දී රජයේ නොපියවූ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 95 සිට 1997 දී සියයට 86 දක්වා අඩු වුවද, දේශීය අංශයෙන් ණය වැඩි වශයෙන් ගැනීම සහ විනිමය අනුපාතිකයේ විචලනය නිසා විදේශීය ණයෙහි රුපියල් වටිනාකම වැඩිවීම යන කරුණු හේතුකොටගෙන රජයේ මුළු නොපියවූ ණය ප්‍රමාණය 2000 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 96 දක්වා වැඩිවිය.

*නොපියවූ රාජ්‍ය ණය*




8.7 රූපසටහන